NEWS RELEASE

UNITED NATIONS
HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER

# අත්තනෝමතික රඳවා ගැනීම් අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකාව වහාම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතුය - එක්සත් ජාතීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ විශේෂඥයෝ කියති

කොළඹ/ ජිනිවා (දෙසැම්බර් 15, 2017 ) - අත්තනෝමතික රඳවා ගැනීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම රටපුරා සිදුවන අත්තනෝමතික රඳවා ගැනීම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුද්ගලික නිදහස සඳහාවූ අයිතිය භුක්ති විඳීමේදී මුහණපානනට සිදුවන සැලකිය යුතු අභියෝග හඳුනා ගෙන ඇත.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණයන් සමග කටයුතු කිරීම හා වදහිංසාවට එරෙහි සම්මුතියේ විකල්ප මුල් කෙටුම්පතට මෑතකදී එකගත්වය පලකිරීමද ඇතුළුව සාධනීය මුලපිරීම් මෙම විශේෂඥයන් පිළිගැනීමට ලක් කරති.

කෙසේවෙතත්, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේවූ ශ්‍රී ලංකාවේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහාත්, රජය 2017-2021 මානව අයිතිවාසිකම් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ලබාදී ඇති පොරොන්දු ඉටුකිරීම සඳහාත්තවදුරටත් හදිසි ක්‍රියාමාර්ග අවශ්‍ය බව ඔවුන් සඳහන් කර තිබේ.

“නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්, ආරක්ෂක හමුදාවන්, අධිකරණ හා අනෙකුත් බලධාරීන් විසින් පුද්ගලික නිදහස සඳහාවූ අයිතියටතවමත් ගරුත්වයක් ලබාදී නොමැති” බව සාමාජිකයන් 3 දෙනෙකුගෙන් යුත් දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සිදුකළ නිල චාරිකාවේ අවසානයේ නිකුත් කළ ප්‍රකාශයේදී මෙම විශේෂඥයන් සඳහන් කර ඇත.

පුද්ගලයන්ගේ නිදහස අහිමි කිරීමේ වත්මන් බලතල පුළුල් පරාසයක ආයතනවලට ව්‍යාප්ථ වී ඇති බව ඔවුන් සඳහන් කළහ. මෙම ආයතනවලට පොලිස් ස්ථාන, බන්ධනාගාර, විවෘත වැඩ කඳවුරු, බාලක හා වැඩිහිටි පුද්ගලයන් සඳහාවූ මධ්‍යස්ථාන, මානසික සෞඛ්‍ය ආයතන හා සන්නද්ධ කණ්ඩායම්වල හිටපු සටන්කාමීන්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ පුද්ගලයන් හා අනතුරුදායක තත්ත්වයන් යටතේ ජීවත්වන පුද්ගලයන් සඳහාවූ පුනරුත්තාපන කඳවුරුද ඇතුළත් වේ.

රිමාන්ඩ් බන්ධනාගාර ප්‍රමාණය ඉක්මවා  පාවිච්චි කිරීම, පුද්ගලයන් රඳවා ගැනීම සඳහා ඵලදායි විකල්පයන් නොමැතිවීම, යල් පැනගිය නීති රාමුව, බොහෝ අවස්ථාවල වදහිංසා හෝ බලහත්කාරය යටතේ ලබා ගන්නා ලද පාපොච්චාරණ මත රඳා පැවතීම ඇතුළු ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම සඳහා හදිසි ප්‍රතිසංස්කරණ අවශ්‍ය බව මෙම විශේෂඥයන් ඉල්ලා සිටිති.

සැකකරුවන් දින නියමයක් නැතුව රැඳවුම් භාරයේ පසුවන විට උසාවි කටයුතු අධික හා අසාධාරණ ප්‍රමාදවලින් උසාවි කටයුතු කෙරෙහි බලපෑමක් සිදුවී ඇති බව ඔවුන් සඳහන් කළහ. නිර්දෝෂ්‍යභාවය පිළිබඳ පූර්ව නිගමනය හා නියමිත ක්‍රියාවලිය සඳහාවූ අයිතීන් තවමත් සම්පූර්ණයෙන් පිළිගැනීමට ලක්වී නොමැති බව තවද ඔවුන් ඔවුන් සඳහන් කළහ.

හදිසි නීතිය ක්‍රියාත්මක වූ කාල වකවානුවේදී පනවන ලද විශේෂ නීති හා බලතල අහෝසි කළ යුතු බව මෙම විශේෂඥයන් ඉල්ලා සිටී. විශේෂයෙන් දශක 4 කට වැඩි කාලයක් අත්තනෝමතික රඳවා ගැනීම් සඳහා ප්‍රධාන වශයෙන් හැකියාව ලබා දුන් සාධකයන්වලින් එකක් වන 1979 වසරේ ත්‍රස්ථවාදය වැළැක්වීමේ පනත ශ්‍රී ලංකා රජය අහෝසි කළ යුතු බව ක්‍රියාකාරී කණ්ඩායම ඉල්ලා සිටී. මෙම පනත දශක 4 ටත් වැඩි කාල වකවානුවක අත්තනෝමතික රඳවා ගැනීම් සඳහා හැකියාව ලබාදුන් ප්‍රධාන සාධකය තිබේ. මේ සඳහා පනවන ඕනෑම නව නීතියක් ජාත්‍යන්තර මානව හිමිකම් හා යහ පරිචයන්ට අනුකූල විය යුතුය.

අත්අඩංගුවට පත්වීමෙන් පසු ඔවුන්ගේ මූලික ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙර වහාම නීති ආධාර ලබා ගැනීම වැනි නියමිත ක්‍රියාවලිය පිළිබඳ මූලික සහතිකයන් කිහිපයක් සාමාන්‍යයෙන්  රැඳවියන් භුක්ති නොවිඳින බව මෙම දූත පිරිස පෙන්වාදී ඇත.

“ විශේෂයෙන් පොලිස් ස්ථානවල නීතිඥයෙකු නොමැතිව බලධාරීන් විසින් රැඳවියන් ප්‍රශ්න කිරීම පිළිබඳ කරුණ දැඩි ලෙස සැලකිල්ලට ගත යුතු” බව විශේෂඥයන් පැවසූහ.

ළමයින්, කාන්තාවන්, වයෝවෘද්ධ පුද්ගලයන්, මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයන් හා දිළිඳුකමෙන් පෙළෙන පුද්ගලයන් වැනි පහසුවෙන් අනතුරකට භාජනය විය හැකි තත්ත්වයන්වල සිටින පුද්ගලයන්ගේ නිදහස අහිමි කිරීම පිළිබඳවද ක්‍රියාකාරී කණ්ඩායම විශේෂ අවධානය යොමු කර ඇත.

" මේ පිළිබඳ පවතින සාධනීය භාවිතයන් හඳුනා ගන්නා නමුත්, පුද්ගලයන්ගේ නිදහස අහිමි කිරීම පිළිබඳවද නෛතික පදනම හා ක්‍රියාපටිපාටීන් පැහැදිළි ලෙස ස්ථාපිත නොවී තිබීම පිළිබඳ සලකා බැලිය යුතු බව" එම විශේෂඥයන් සඳහන් කළහ.

"මෙම පසුබිම තුළ අත්තනෝමතිකභාවයට එරෙහි ඵලදායි ආරක්ෂාවන් නොමැති අතර, ස්වාධීන අධීක්ෂණය හා පාලනය සඳහා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී."

2017 දෙසැම්බර් මස 4-15 දිනයන්හි සිදුකළ මෙම චාරිකාවේදී මෙම දූත පිරිස රජයේ නිලධාරීන්, විනිසුරුවරුන් හා නීතිඥයන්, සිවිල් සමාජ සංවිධාන හා අනෙකුත් අදාළ කණ්ඩායම් හා නිලධාරීන් හමුවූහ. ඔවුන් කොළඹ, මීගමුව, අනුරාධපුරය, වව්නියාව, ත්‍රිකුණාමලය හා පොලොන්නරුව යන ප්‍රදේශවල චාරිකාවල යෙදුනු අතර, පුද්ගලයන් රැඳවුම් භාරයේ සිටින විවිධ ස්ථාන 30 කට වැඩි ප්‍රමාණයකට ගොස්, නිදහස අහිමිවී සිටින පුද්ගලයන් 100 කට වැඩි පිරිසක් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වූහ.

මෙම දූත පිරිසට ක්‍රියාකාරී කණ්ඩායමේ ක්‍රියාකාරී සාමාජිකයන් වන ජෝ ඇන්ටෝනියෝ ගුවේරා බර්මූඩස්, ලී ටූමේ හා එලීනා ස්ටීනර්ට් යන අය ඇතුළුවී සිටි අතර, මානව හිමිකම් සඳහාවූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් ඔවුන්ට සහාය ලබාදෙන ලදී.

ක්‍රියාකාරී කණ්ඩායම මෙම චාරිකාව පිළිබඳ අවසන් වාර්තාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය වෙත 2018 සැප්තැම්බර් මස ඉදිරිපත් කිරීමට නියමිතය.

----------නිමාව--------

*අත්තනෝමතික රඳවා ගැනීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම ලෝකයේ කලාප පහකට අයත් ස්වාධීන විශේෂඥ සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විත වේ:* ***ජෝගුවාරා මහතා (මෙක්සිකෝව), වත්මන් වාර්තාකරු - ප්‍රධානීන් ; එලීනා ස්ටෙනට් මහත්මිය (ලැට්වියා), ලී ටූමේ මහත්මිය (ඕස්ට්‍රේලියාව) සියොන්ග් ෆිල් හොන්ග් මහතා (කොරියා ජන රජය) හා සෙටොන් රෝලන්ඩ් ඇඩ්ජෝවි මහතා (බෙනින්).***

*ක්‍රියාකාරී කණ්ඩායම් මානව හිමිකම් කවුන්සලයේ විශේෂ ක්‍රියාපටිපාටීන් ලෙස හඳුන්වනු ලබන අංශයේ කොටසක් වේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පද්ධතියේ ස්වාධීන විශේෂඥයන්ගේ විශාලතම කණ්ඩායම වන මෙම විශේෂ ක්‍රියාපටිපාටීන්, කවුන්සලයේ ස්වාධීනව කරුණු සොයා බැලීමේ හා අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයන්වල පොදු නාමය වේ. විශේෂ ක්‍රියාපටිපාටීන් සඳහාවූ මැන්ඩේට් බලධාරීන් නිශ්චිත රටකතත්ත්වයන් හෝ ලෝකයේ සියලුම ප්‍රදේශවල තේමාවන් යටතේවූ ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා මානව හිමිකම් කවුන්සලය විසින් පත් කරනු ලබන ස්වාධීන මානව හිමිකම් විශේෂඥයන් වේ. ඔවුන් එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයට අයත් නොවන අතර, කිසිම රජයේ ආයතනයකට සම්බන්ධ නොවී ස්වාධීනව කටයුතු කරති. ඔවුන් තමන්ගේ පුද්ගලික මට්ටමෙන් කටයුතු කරන අතර, තමන්ගේ වැඩ සඳහා වැටුපක් ලබා නොගනිති.*

*එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ ශ්‍රී ලංකාව සඳහා වූ පිටුව - [Sri Lanka](Sri Lanka)*
*වැඩිදුර තොරතුරු හා මාධ්‍ය ඉල්ලීම් සඳහා කරුණාකර සම්බන්ධ වන්න:*
***කොළඹදී :***
*UN Communications (+94 (0) 774448401 /info.lk@one.un.org)*

***ජිනීවාහිදී (චාරිකාවට පෙර හා පසු ):***
*Lucie Viersma (+41 22 928 9380 /lviersma@ohchr.org)*
*Francisco Alfonzo (+41 22 917 9822 /falfonzo@ohchr.org)*
*or write to wgad@ohchr.org*

එක්සත් ජාතීන්ගේ අනෙකුත් ස්වාධීන විශේෂඥයන් පිළිබඳ මාධ්‍ය විමසීම් සඳහා කරුණාකර සම්බන්ධ වන්න:

*Jeremy Laurence – Media Unit (+ 41 22 917 9383 / jlaurence@ohchr.org)*

අප ජීවත්වන ලෝකය පිළිබඳ සැලකිල්ලක් දක්වනවාද? එසේ නම්, ඕනෑම පුද්ගලයෙකුගේ අයිතිවාසිකම් සඳහා අදම හඬ නගන්න.
#Standup4humanrights and visit the web page at http://www.standup4humanrights.org